ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2277/02 - 2022 අප්‍රේල් මස 25 වැනි සඳුදා - 2022.04.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින් මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත්කරමි ; එනම් -

1. සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (මෙහි මින්මතු "SDP" පනත යනුවෙන් සඳහන් කරනු ලබන) 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගෙන ඇත්තාවූ ද, එ.ජ.ඩො. මිලියන 821.6 ක අපේක්ෂිත ආයෝජනයක් සහිතව වසර 18 ක කාලසීමාවක් සඳහා රාජ්‍ය-පෞද්ගලික-හවුල් ව්‍යාපාරයක් (PPP) වශයෙන් නිර්මාණය කිරීමේ - ඉදි කිරීමේ - මූල්‍යකරණය කිරීමේ - මෙහෙයවීමේ - නඩත්තු කිරීමේ සහ පැවරීමේ (DBFOMH) පදනමක් මත ක්‍රියාත්මක කරනු ලබන (මෙහි මින්මතු "ව්‍යාපෘතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජගිරිය හරහා නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වූ මංතීරු හතරක අධිවේගී ගුවන් මාර්ගයක් ඉදිකර ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතියට අදාළ තොරතුරු අන්තර්ගත නිවේදනය 2021 නොවැම්බර් මස 15 වැනි දින අංක 2254/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබීය.

2. එ.ජ.ඩො. මිලියන 821.6 ක අපේක්ෂිත ආයෝජනයක් සහිතව වසර 18 ක කාලසීමාවක් සඳහා රාජ්‍ය-පෞද්ගලික-හවුල් ව්‍යාපාරයක් (PPP) වශයෙන් නිර්මාණය කිරීමේ - ඉදි කිරීමේ - මූල්‍යකරණය කිරීමේ - මෙහෙයවීමේ - නඩත්තු කිරීමේ සහ පැවරීමේ (DBFOMH) පදනමක් මත ක්‍රියාත්මක කරනු ලබන රාජගිරිය හරහා නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වූ මංතීරු හතරක අධිවේගී ගුවන් මාර්ගයක් ඉදිකර, ක්‍රියාත්මක කර, පවත්වාගෙන යෑම සඳහා වූ ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා SDP පනතේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව 2022 මාර්තු මස 14 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

1A - PG 5827 — 531 (2022/04)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය "එ.ජ.ඩො. මිලියන 821.6 ක අපේක්ෂිත ආයෝජනයක් සහිතව රාජ්‍ය-පෞද්ගලික-හවුල් ව්‍යාපාරයක් (PPP) වශයෙන් නිර්මාණය කිරීමේ - ඉදි කිරීමේ - මූල්‍යකරණය කිරීමේ - මෙහෙයවීමේ - නඩත්තු කිරීමේ සහ පැවරීමේ (DBFOMH) පදනමක් මත රාජගිරිය හරහා නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වූ මංතීරු හතරක අධිවේගී මාර්ගයක් ඉදිකර, ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතියක්" ලෙස හඳුන්වනු ලැබිය යුතු සහ සඳහන් කරනු ලැබිය යුතු අතර මෙම ව්‍යාපෘතිය භාර ගැනීමේ ව්‍යාපෘති සමාගම වනුයේ CHEC NKBA එලිවේටඩ් හයිවේ (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති ආයතනය වේ.

4. එ.ජ.ඩො. මිලියන 821.6 ක අපේක්ෂිත ආයෝජනයක් සහිතව රාජ්‍ය-පෞද්ගලික-හවුල් ව්‍යාපාරයක් (PPP) වශයෙන් නිර්මාණය කිරීමේ - ඉදි කිරීමේ - මූල්‍යකරණය කිරීමේ - මෙහෙයවීමේ - නඩත්තු කිරීමේ සහ පැවරීමේ (DBFOMH) පදනමක් මත රාජගිරිය හරහා නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වූ මංතීරු හතරක අධිවේගී මාර්ගයක් ඉදිකර, ක්‍රියාත්මක කිරීම කර, පවත්වාගෙන යෑම සඳහා වූ ඉහත කී ව්‍යාපෘතිය විසින් සහන ගිවිසුම බලාත්මක වන දිනයේ සිට වසර තුනක (03) කාලසීමාවක් ඇතුළත ව්‍යාපෘතිය ක්‍රියාත්මකකර ස්වකීය වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය.

5. මෙම නියමයේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පැනවීම්වලින් නිදහස්වීම "රාජගිරිය හරහා නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වූ මංතීරු හතරක අධිවේගී මාර්ගයක් ඉදිකර, ක්‍රියාත්මක කර, පවත්වාගෙන යෑම සඳහා වූ ව්‍යාපෘතිය" සම්බන්ධයෙන් අදාළ වන්නේය. තව ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා, සහන ගිවිසුම අත්සන් කිරීමේ දිනයේ සිට සහන ගිවිසුමේ සඳහන් බලාත්මක වීමේ දිනය අතර කාලසීමාව තුළදී, උපලේඛනයේ 2 වන වගන්තියේ සිට 6 වන වගන්තිය දක්වා වූ වගන්තිවල සඳහන් ආනයන සම්බන්ධයෙන්, එම සහන ම අදාළ විය යුතු ය.

**උපලේඛනය**

1. **2017 අංක 24 දරන දේශීය ආදායම් පනත.**

<u>සංස්ථාපිත ආදායම් බද්ද</u>

වසර තුනක (3) ඉදිකිරීම් කාලසීමාව තුළ දී සහ ඉදිකිරීම් කාලසීමාවෙන් පසුව එළඹෙන වසර පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළ දී, ව්‍යාපෘති සමාගම විසින් උපයනු ලබන ලාභ සහ ආදායම, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ සංස්ථාපිත ආදයම් බද්ද ගෙවීමෙන් නිදහස් වන්නේය.

<u>ලාභාංශ මත බද්ද.</u>

ලාභාංශ ආදායම බෙදාදීම සම්බන්ධයෙන් ව්‍යාපෘති සමාගමේ කොටස් හිමියන් සඳහා ලබාදෙන ලාභාංශ මත වසර පහළොවක (15) මෙහෙයුම් සහ පවත්වාගෙන යෑමේ කාලසීමාව තුළ දී සහ ඉන්පසුව එක් වසරක් (01) සඳහා බදු ගෙවීමෙන් නිදහස් වන්නේය.

<u>විදේශ ණය සඳහා ගෙවනු ලබන පොළිය මත, උපදේශකවරුන් සඳහා ගෙවනු ලබන ගාස්තු මත, කළමනාකරණ ගාස්තු මත සහ රාජ්‍ය භාගය (Royalty Payment) මත අයකරනු ලබන බද්ද.</u>

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ; එනම්

(i) ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගන්නා විදේශ ණය පොළිය මත ;

(ii) වසර තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළදී උපදේශකවරුන් සඳහා [හතළිස් දෙනකු (40) දක්වා] ගෙවනු ලබන ගාස්තු සහ ඉදිකිරීම් කාලසීමාව අවසන් වීමෙන් පසුව වසර පහළොවක (15) පවත්වාගෙන යෑමේ කාලසීමාව තුළ දී උපදේශකවරුන් විස්සක් (20) දක්වා ප්‍රමාණයකට ගෙවනු ලබන ගාස්තු මත ; සහ

(iii) ව්‍යාපෘතිය ඉදිකිරීම් වසර තුනක (03) කාලසීමාව තුළ දී සමස්ථ ව්‍යාපෘති පිරිවැයෙන් සියයට පහක් (05) නොඉක්මවන කළමනාකරණ ගාස්තු සහ රාජ්‍ය භාග ගෙවීම් මත සහ ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලසීමාවෙන් පසුව එළඹෙන වසර පහළොවක (15) නඩත්තු කිරීමේ කාලසීමාව තුළ දී සමස්ථ ව්‍යාපෘති පිරිවැයෙන් සියයට දෙකක් (02) නොඉක්මවන කළමනාකරණ ගාස්තු සහ රාජ්‍ය භාග ගෙවීම් මත ;

රඳවුම් බද්ද (WHT) ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේය.

ප්‍රාග්ධන ඉපයීම් බද්ද.

වසර තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළ දී සහ එම ඉදිකිරීම් කාලසීමාව අවසන්වීමෙන් පසුව වසර පහළොවක (15) මෙහෙයුම් සහ පවත්වාගෙ යෑමේ කාලසීමාව තුළ දී ප්‍රාග්ධන ඉපැයීම් බද්ද ගෙවීමෙන් ව්‍යාපෘති සමාගමේ කොටස් හිමියන් සහ ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේය.

සේවා නියුක්තිය මත ආදායම් බද්ද.

ව්‍යාපෘතිය සම්බන්ධ සේවා නියුක්තියෙන් උපචිත වන ලැබීම් සහ ලාභ තුළින් උත්පාදනය වන ආදායම් බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගමේ විදේශීය සේවා නියුක්තිකයන් (තාක්ෂණික සහ කළමනාකරණ ප්‍රවීණයන්) පහත ආකාරයට නිදහස් වන්නේය.

(i) ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේ දින සිට වසර තුනක (03) කාලසීමාවක් දක්වා [උපරිම වශයෙන් විදේශීය සේවා නියුක්තිකයන් හතළිස් දෙනෙකුට (40) යටත්ව] ;

(ii) ඉදිකිරීම් කාලසීමාවෙන් පසුව වසර පහළොවක (15) කාල සීමාවක් දක්වා [උපරිම වශයෙන් විදේශීය සේවා නියුක්තිකයන් විසි දෙනෙකුට (20) යටත්ව]

**2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත (VAT බදු පනත).**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (මෙහි මින්මතු "BOI" යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයනය කිරීම් සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන සේවාවන්, වසර තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළ දී සහ ඉදිකිරීම් කාලසීමාව අවසන්වීමෙන් පසුව එළඹෙන වසර පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළ දී එකතු කළ අගය මත බදු (VAT බදු) ගෙවීමෙන් නිදහස් වන්නේය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් අනුමත කරනු ලබන ආකාරයට ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ දේශීය වශයෙන් මිලදී ගැනීම් මත සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සේවා මත අයකරනු ලබන වැට් බදු (VAT) ව්‍යාපෘතිය ඉදිකිරීමේ වසර තුනක (03) කාලසීමාව තුළ සහ එම ඉදිකිරීම් කාලසීමාව අවසන් වීමෙන් පසුව මෙහෙයුම් සහ පවත්වාගෙන යෑමේ වසර පහළොවක (15) කාලසීමාව තුළ විලම්භනය කරනු ලැබේ.

තවද සහන ගිවිසුම යටතේ ලැබිය යුතු පොළී ආදායම ඇතුළු ශ්‍රී ලංකා රජය විසින් ව්‍යාපෘති සමාගම වෙත ලබාදිය යුතු අර්ධ වාර්ෂික සේවා ගාස්තුව ඉදිකිරීම් කාලසීමාව අවසන් වීමෙන් පසුව එළඹෙන වසර පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළ දී එකතු කළ අගය මත බදු (VAT බදු) ගෙවීමෙන් නිදහස් වන්නේය.

**3. 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත.**

ව්‍යාපෘතිය ආශ්‍රිත ආනයන භාණ්ඩ ව්‍යාපෘති සමාගම නමින් අනුප්‍රේෂණය (consigned) කර ඇත්නම්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් අනුමත කරනු ලබන ආකාරයට (ව්‍යාපෘති සමාගම විසින් ඍජුවම ආනයනය කරන ලද හෝ යම් කොන්ත්‍රාත්කරුවකු/කොන්ත්‍රාත්කරුවන් සහ එහි උප-කොන්ත්‍රාත්කරවකු/උප කොන්ත්‍රාත්කරුවන් හරහා ලබා ගත්) ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන භාණ්ඩ, සඳහා සහන ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට වසර තුනක (03) ඉදි කිරීම් කාලසීමාව තුළ සහ ඉදිකිරීම් කාලසීමාවෙන් පසු වසර පහළොවක (15) මෙහෙයුම් හා නඩත්තු කලසීමාව තුළ වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) අයකිරීමෙන් සහ ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේය.

**4. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත.**

ව්‍යාපෘතිය ආශ්‍රිත ආනයන භාණ්ඩ ව්‍යාපෘති සමාගම නමින් අනුප්‍රේෂණය (consigned) කර ඇත්නම්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් අනුමත කරනු ලබන ආකාරයට ව්‍යාපෘති සමාගම, එහි කොන්ත්‍රාත්කරු/කරුවන් සහ එහි උප-කොන්ත්‍රාත්කරු/කරුවන් විසින් ආනයනය කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත ආනයන අයිතම, සහන ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට වසර තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළ සහ ඉදිකිරීම් කාලසීමාවෙන් පසු වසර පහළොවක (15) මෙහෙයුම් හා නඩත්තු කාලසීමාව තුළ නිෂ්පාදන බදු අයකිරීමෙන් සහ ගෙවීමෙන් නිදහස් වන්නේය.

**5. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත.**

ව්‍යාපෘතිය ආශ්‍රිත ආනයන භාණ්ඩ ව්‍යාපෘති සමාගම නමින් අනුප්‍රේෂණය (consigned) කර ඇත්නම්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් අනුමත කරනු ලබන ආකාරයට ව්‍යාපෘති සමාගම, එහි කොන්ත්‍රාත්කරු/කරුවන් හෝ එහි උප-කොන්ත්‍රාත්කරු/කරුවන් විසින් ආනයනය කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත ආනයන අයිතම, සහන ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට වසර තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළ සහ ඉදිකිරීම් කාලසීමාවෙන් පසු වසර පහළොවක (15) මෙහෙයුම් හා නඩත්තු කලසීමාව තුළ සෙස් බදු (CESS) අයකිරීමෙන් සහ ගෙවීමෙන් නිදහස් වන්නේය.

**6. රේගු ආඥාපනත (235 වන පරිච්ඡේදය)**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් අනුමත කරනු ලබන ආකාරයට (මුදල් අමාත්‍යාංශය විසින් පළකරනු ලද නිෂේධන ලේඛනයේ ලැයිස්තු ගත කර ඇති අයිතම හැර) ව්‍යාපෘතිය ආශ්‍රිත ආනයන භාණ්ඩ ව්‍යාපෘති සමාගම නමින් අනුප්‍රේෂණය කර (consigned) ඇත්නම්, ව්‍යාපෘති සමාගම විසින් ඍජුවම ආනයනය කරන ලද හෝ යම් කොන්ත්‍රාත්කරුවකු/කරුවන් හරහා උප-කොන්ත්‍රාත්කරුවකු/කරුවන් හරහා ලබාගත් ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම ආනයන අයිතම, සහන ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට වසර තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළ සහ ඉදිකිරීම් කාලසීමාවෙන් පසු වසර පහළොවක (15) මෙහෙයුම් හා නඩත්තු කිරීමේ කාලසීමාව තුළ රේගු ආනයන බද්ද (CID) අය කිරීමෙන් සහ ගෙවීමෙන් නිදහස් වන්නේය.

එසේ වුවද, නිෂේධන ලේඛනයේ සඳහන් අයිතම සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය නොකරනු ලබන හෝ ප්‍රමාණවත් තත්ත්වයෙන් හා ප්‍රමාණයෙන් නොමැති අවස්ථාවක ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට ගතවන කාලසීමාව සැලකිල්ලට ගෙන එම අයිතම ආනයනය කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් සලකා බලනු ලැබිය යුතුය.

**මහින්ද රාජපක්ෂ** පා.ම.,
ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක
කිරීමේ අමාත්‍ය.

2022 අප්‍රේල් මස 25 වැනි දින,
ආර්ථික ප්‍රතිපත්ති සහ සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ දී ය.

EOG 04 - 0224